Proceedings of the 8th Academic Sessions, University of Ruhuna 2010
Vol. 8 pgs 147 – 150

**CF - 04**

# පහළ ඌව ජන දිවි පෙවෙත හා බැඳි විවාහ චාරිත්‍ර

**ප්‍රියදර්ශනී, එල්. ඒ. එස්.**

*සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර, ශ්‍රී ලංකාව.*

✉liyanarachchi93@gmail.com

**සාර සංක්ෂේපය**

එක ම රටක් තුළ වුව ද සංස්කෘතිකාංග භාවිතයේ දී ඒ ඒ ප්‍රදේශයන් අනුව විවිධ වෙනස්කම් දක්නට ලැබේ. ප්‍රාදේශීය වශයෙන් එක් එක් ප්‍රදේශයට අනන්‍ය වූ චාරිත්‍ර වාරිත්‍ර සමූහයක් සහ ඒ සමඟ බැඳුණු ජන වහරෙහි සුවිශේෂතා රැගත් ප්‍රදේශයක් වශයෙන් ඌව පළාතෙහි පහළ ඌව ප්‍රදේශය හැඳින්විය හැකි ය.

මෙම ප්‍රදේශයට ආවේණික වූ විවාහ චාරිත්‍ර අද වන විට යම් යම් වෙනස් වීම්වලට බඳුන් වී නවීකරණය වී ඇතත් අතීතයේ එය ඉතා ම විචිත්‍රවත් සිංහල බෞද්ධ චාරිත්‍රවලට මුල් තැනක් දුන් සංස්කෘතිකමය වටිනාකමින් යුත් උළෙලක් විය. මංගල උත්සවයේ පූර්ව චාරිත්‍ර, මංගල්‍යය දිනයේ චාරිත්‍ර හා පසු චාරිත්‍ර යනාදී වශයෙන් වෙන් කොට හඳුනාගත හැකි චාරිත්‍ර සමූහයකි. මේ සෑම අවස්ථාවක දී ම මෙම ප්‍රදේශයට පමණක් ආවේණික වූ භාෂා රටාවක් අපට හමු වේ. ඒ අනුව පහළ ඌව ප්‍රදේශයේ බිබිල හා මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක ආශ්‍රිතව ගවේෂණය කර ලබා ගන්නා ලද තොරතුරු අනුව එම ප්‍රදේශයේ ජනතාවගේ විවාහ මංගල චාරිත්‍ර හා ඒ සමඟ බැඳී පවතින ඔවුන්ට ම අනන්‍ය වූ බස්වහර පිළිබඳ කරුණු මෙයින් අනාවරණය කෙරේ.

## හැඳින්වීම

ඌව පළාත ලංකාවේ ප්‍රධාන පරිපාලන බෙදීම්වල එන විශාලතම පළාත් අතුරෙන් එකකි. අතීතයේ විසිදහස් රට යනුවෙන් හැඳින්වුණ මෙම ප්‍රදේශය පැරණි පාලන බෙදීම්වලට අනුව රුහුණු රටට අයත් වූවකි. ඌව පළාත දැනට බදුල්ල හා මොනරාගල ලෙස දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත වන අතර බදුල්ල දිස්ත්‍රික්කය ඉහළ ඌව ලෙසත් මොනරාගල දිස්ත්‍රික්කය පහළ ඌව ලෙසත් හැඳින්වේ. වෙල්ලස්ස, රන්දෙනිගල, මාලිගාවිල, බුත්තල වැනි ස්ථාන රාශියක් පහළ ඌවට අයත් වීමෙන් මෙම ප්‍රදේශය ඓතිහාසික වශයෙන් වැදගත් භූමියක උරුමය රැගත් පිරිසක් වෙසෙන ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකි ය.

දේශගුණික සාධක සලකා බැලූ කල්හි ඉහළ ඌව ප්‍රදේශය කඳුවලින් ගහන වූ ප්‍රදේශයක් නිසා වර්ෂාව ලැබීමේ වැඩි ප්‍රතිශතයක් දැකිය හැකි වුවත් තැනිතලා බිම් වැඩියෙන් පිහිටා ඇති  පහළ ඌව ප්‍රදේශයට වර්ෂාව ලැබෙන්නේ තරමක් අඩුවෙන් ය. වසරේ මැද මාස තුනක පමණ කාලයක් මෙහි දැඩි නියං තත්ත්වයක් දැකිය හැකි ය. එනිසා ම මෙම ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන්නේ ගොවිතැන යි. වී ගොවිතැනට මෙන් ම හේන් ගොවිතැනට ද උපතින් ම දස්කම් ඇති මෙහි ගොවියෝ කම්මැලි නැත. වියළි කලාපයට අයත් වන මෙම ප්‍රදේශයේ වසරේ වැඩි කාලයක් පුරා උද්ගත වන  ජල ප්‍රශ්නය නිසාවෙන් මොවුන්ගේ දෛනික ජීවිතය ඉතා කටුක බවින් යුක්ත වේ . ඒ පිළිබඳව කිසිදු පසුතැවීමකින් තොරව තම දෛනික කටයුතු කරගෙන යාමට ඔවුහු උත්සුක වෙති.    මෙම ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය හා සෘජුව ම බැඳී පවතින කරුණක් ලෙස ඔවුන් ව්‍යවහාර කරන භාෂා රටාව හඳුනා ගත හැකි ය. ගොවිතැන් කටයුතුවල දී, අවතරණ අවස්ථාවන්හි දී  මෙන් ම දෛනික ජීවිතයේ ඔවුන් ව්‍යවහාර කරන නෑදෑ ඇමතුම් රටාවන්, ජන කියමන් හා ජන ව්‍යවහාර යනාදියෙන් මෙහි භාෂාවෙහි  වෙනස් බව සහ සුබනම්‍ය බව මැනවින් දැකිය හැකි ය. වැඩිහිටියන්ට ගරු කරමින්, දේශීය සංස්කෘතියට අනුගතව තමන්ට අනන්‍ය වූ බස් වහර රැක ගැනීමට ඌව පළාතේ ගැමියෝ උත්සුක වෙති.

## ක්‍රමවේදය

උක්ත මාතෘකාවට අදාළ තොරතුරු පහළ ඌවේ බිබිල හා මැදගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක ප්‍රමුඛ කොට ගෙන ඉදිරිපත් කෙරේ. එහි දී අරමුණු කර ගනු ලබන්නේ පහළ ඌව ප්‍රදේශයට ආවේණික වූ විවාහ චාරිත්‍රවල සුවිශේෂතා හඳුනා ගැනීමත්, මෙම ප්‍රදේශයට අනන්‍ය වූ ජන වහරෙහි විශේෂතා පිළිබඳව අධ්‍යයනය කිරීමත් ය. උක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයනය යන ක්‍රමවේදයන් මූලිකව ම භාවිත කළ අතර එසේ සපයා ගත් තොරතුරු තව දුරටත් සාධනය කිරීම් වස් ලිඛිත මූලාශ්‍රයන් ද උපයෝගී කර ගැණුනි.

## අන්තර්ගතය

පහළ ඌව ප්‍රදේශයේ ප්‍රසිද්ධ විවාහ චාරිත්‍ර ඉතා ම සාම්ප්‍රදායික මුහුණුවරක් ගනී. පුද්ගලයෙකුගේ ජීවිතයේ දෙ වන උපත ලෙස සැලකෙන ගැහැණු, පිරිමි දෙපාර්ශවයට ම ඉතා වැදගත් වන කටයුත්තක් ලෙස විවාහය හැඳින්විය හැකි ය. අතීතයේ සිට අද දක්වා ම පහළ ඌවේ ගැමියන් විවාහය හා සම්බන්ධ චාරිත්‍ර සිදු කරනු

ලැබුවේ ඔවුන්ට ම ආවේණික සිරිත් විරිත්වලට අනුකූලව ය. විවාහ වීම අතීතයේ පහළ ඌවේ ගැමියෝ හැඳින්වූයේ ''**බැඳි යනවා**'' යනුවෙනි. එහෙත් අද වන විට එය ''**සහේට ගන්නවා** , හා'' **කසාද බඳිනවා**'' යනාදී ලෙස හැඳින්වේ.

වැඩිවිය පත් "**ගැටිස්සියක්**" හෝ "**ගැටවරයෙක්**" සිටිනා නිවසක දෙමාපිය වැඩිහිටියන්ට පැවරෙන විශාල වගකීමක් ලෙස මෙය සැලකේ. පහළ ඌවේ තරුණයෝ අතීතයේ දී ද අද මෙන් ම ''**කෙල්ලන්ට කල් බඳිති**''. කල් බැඳීම යනු ''**ආලය කරනවා** '' යන්නයි. බොහෝ ගැටව් "**උරේ එතනාට**" ආලය කරති. උරේ එතනා යනු ඇවැස්ස නෑනා ය (කහඳගමගේ,1998;08). ලේ ඥාතීන් අතර විවාහ ගනුදෙනු සිදුවීම ඌව පළාතේ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණයක් වන අතර එය ක්‍රම කිහිපයක් අනුව සිදු කරනු ලැබේ. දීග විවාහය, බින්න විවාහය, හා එකගෙයි කෑමේ විවාහය යන විවාහ ක්‍රම මෙම ප්‍රදේශයේ ජනතාව අතර බහුලව සිදු වේ.

දීග විවාහයේ දී මනාලිය මනාලයාගේ නිවසේ පදිංචියට ''**කැන්දාගෙන යන**'' අතර බින්න විවාහයේ දී මනාලයා මනාලියගේ නිවසේ නතරවීම හෙවත් ''**බින්න බැහීම**'' සිදු වේ. ඇතැම් විට එක ම නිවසේ සොහොයුරන් සියලු දෙනා ම එක් කාන්තාවක අඹුව වශයෙන් කැන්දා ගෙන ඒම සිදු විය. දේපළ පිට යෑම වැලැක්වීම අරමුණු කොට ගෙන කරන ලද මෙම විවාහ ක්‍රමය ''**එක ගෙයි කෑම**'' ලෙස හැඳින්වේ. ප්‍රේම සම්බන්ධතා මත ද විවාහ සිදු වුවත් ඊට අදාළ සිරිත් විරිත් ආදිය සිදු කළේ වැඩිහිටියන්ගේ අනුදැනුම ඇතිව ය. යෝජිත විවාහයක දී විවාහ යෝජනාව තරුණයාගේ පාර්ශවයෙන් ඔහුගේ ඇවැස්ස නෑනා හෙවත් ''**උරේ එතනා**'' සිටින නිවසට මුලින් ම ඉදිරිපත් වේ. තරුණ පුතෙකු සිටින නිවසක පියා තම ලේ ඥාතීන් හමුවට විවාහ යෝජනාව රැගෙන යාම එකල පහළ ඌවේ අනිවාර්යෙන් සිදු වූවකි. ''**උරේ මාමා**'' ගේ හෙවත් මවගේ සහෝදරයාගේ නිවසට මෙම යෝජනාව රැගෙන ගොඩ වදින තරුණයාගේ පියා ''**ආ ගිය තොරතුරු**'' කතා බහ කොට අවසානයේ අදාළ කාරණය සෘජුව ම ඉදිරිපත් කරයි. තරුණිය වෙනත් තැනකට විවාහ කර දීමට ''**තීන්දු වී**'' ඇත්නම් ඒ වෙලාවෙහි කිසිත් නො කියා කෑමෙන් බීමෙන් හොඳින් සංග්‍රහ කර '' **මාත් ඔය පැත්තේ ඇවිත් යන්න එන්නම්කො**'' යි තරුණියගේ පියා පවසයි. ඒ වදන්වලින් ම තරුණිය වෙනත් තැනකට තීන්දු වී ඇති බව වටහා ගන්නා තරුණයාගේ පියා තම පුතුට වෙනත් තැනකින් ''**කටයුත්තක් බැලීමට**'' තීරණය කරයි.

පිටස්තර තැනකින් කටයුත්තක් බැලීමට යන්නේ පිය පුතු දෙදෙනා ය. ආහාර ගන්නා වේලාවකින් පසුව අදාළ නිවසට කලින් නො දන්වා එම නිවස පිළිබඳ තොරතුරු වටින් ගොඩින් විමසා යාම සිරිත යි. දෙමාපියන් සාමාන්‍ය වශයෙන් ආ ගිය තොරතුරු කතා කරන අතර තරුණයා වටපිටාව පිළිබඳව ''**සෝදිසි කිරීම්**'' කරයි. එම නිවසේ තරුණිය පිළිබඳ තරුණයාගේ කැමැත්ත කුමක් වුවත් පීතෘ මූලික සමාජයේ පියාගේ කැමැත්තට අනුව සියල්ල සිදු වේ. පසු දිනයක නැවත තරුණියගේ නිවසට යෑමට අවසර ලබා ගනී. දෙ වන වර මව, පියා සහ පුතු ද ''**බාරකාරයකු**'' ද මේ ගමනට එක් වෙති. ''**වහුම්පුර**'' කුලයේ අය උසස් කුලවල අයට නෑ ගමන් ,''**මඟුල්තුලා**'' ආදිය සඳහා බර ගෙනයාමේ කාර්යයට සහභාගී වීම එකල සිදු වූවකි.

තරුණියගේ නිවසේ දී ආහාරපානවලින් සංග්‍රහ විඳි පසු මනාලයාගේ පියා ''**ඉලත්තට්ටුවක්**'' ගෙන එයට බුලත්, පුවක් ආදිය දමා සුදු රෙද්දකින් වසා තරුණියගේ පියාට පිළිගන්වයි. එයින් මෙම කටයුත්තට ගෞරවයක් හා චාරිත්‍රානුකූල බවක් දීම අදහස් කෙරේ. මේ අතර තරුණිය හොඳින් දැක බලා ගැනීමට තරුණයා උත්සුක වේ. මේ කතාබහ අතරතුර එම නිවසේ මව තම දියණියට වතුර කළයක් ගෙනෙන ලෙස නියම කරන අතර ඒ මඟින් තරුණයාට තරුණිය හොඳින් දැක බලා ගැනීමට අවස්ථාව සලසා දේ. තරුණ සිත්වල ලැජ්ජාව , භය නො සිඳෙන ආකාරයට කටයුතු කිරීමේ වැඩිහිටියන් සතු දක්ෂතාව මෙයින් මනාව පසක් වේ. තරුණියගේ පාර්ශවයෙන් කැමැත්ත හෝ අකමැත්ත ප්‍රකාශ කරනුයේ තරුණයාට ඇති වත් පොහොසත්කම් ආදිය සොයා බැලීමෙන් අනතුරුව ය. මංගල්‍යය තීන්දු වන්නේ ඉන් පසුව ය. මෙම චාරිත්‍ර පූර්ව මංගල චාරිත්‍ර ලෙස හඳුනාගත හැකි ය.

මෙම ප්‍රදේශයේ මංගල කටයුතු ''**ආටෝප**'' ගතියකින් යුක්ත ය. මනාලිය කැන්දාගෙන ඒම සඳහා විශේෂ පිරිසක් ''**ලකලෑහැස්ති වීම**'' මෙහි මගුල් තුලාවල දකින්නට ලැබෙන සුවිශේෂී අංගයකි. එහි දී **මනාලයා** , **අප්පු** (අවිවාහක තරුණයකු / නූතනයේ දෙවැනි මනාලයා), **කේලංකාරයා** (කපුවා වැනි කෙනෙක්), **දැනමුතු රාළ** (වැඩිහිටි ලේ ඥාතියෙක්, **දෙමාපියන් වෙනුවට හිමෙතෙෂී වැඩිහිටි යුවලක්),** රෙදි පෙට්ටිය ගෙන යන කාන්තාවක් (බර ගෙන යන කුලයේ කෙනෙකු විය යුතු ය.), **බරකාරයෙක්**, **මාන්නකාරයෝ, වෙඩික්කාරයෙක්.....** ආදී ලෙස සංවිධානාත්මක පිරිසක් මනාලිය කැන්දාගෙන ඒමට යයි. රෙදි පෙට්ටිය ගෙන එන පහළ කුලයේ කාන්තාව හොඳ පෙනුමක් හිමි අම්මා කෙනෙකු විය යුතු ය . මනාලියට අන්දවනු ලබන ඇඳුම් පැළඳුම් සියල්ල ඇත්තේ මෙම කාන්තාව ගෙන යන පෙට්ටියේ ය. විවාහය සිදුවන පවුල්වල තරාතිරම අනුව ''**බරකාරයින්ගේ**'' ප්‍රමාණය ද තීරණය වේ. වහුම්පුර කුලයේ අය මේ සඳහා යොදා ගන්නා අතර බරකාරයන්ගේ කත්වල දෙපස වේවැල්වලින් වියන ලද '' තවුලා'' තුනක් බැගින් බැඳ ඇත. ඒවායේ කැවුම්, අතිරස, ආස්මි, කොකිස්, කිරිබත් ආදියත් කෙසෙල් ගෙඩි වෙන ම කදක ගෙන යාමත් සිදු වේ. පහළ ඌවේ මගුල් තුලාවක මෙවැනි කත් පහක් පමණ ගෙන යයි. ''**මහ බුලත් මල්ලක්**'' ගත් බරකාරයෙකු ගෙන යාම ද චාරිත්‍රයකි. මෙම චාරිත්‍රය මෙම ප්‍රදේශයට පමණක් ආවේණික වූවකි. ''**මහ බුලත් මල්ලට** '' බුලත් මිටි හතරක් හෝ පහක්, පුවක් ගෙඩි දෙසීයක් පමණ , හුණු මුල් ..... ආදිය ඇතුලත් වේ. එසේ ම මංගල ගමන සඳහා ''**මාන්න පහක්**'' රැගෙන යාම ද සුවිශේෂී කරුණකි. ඒ සඳහා ධනවත් කුලීන පවුල්වල ගෙන යන්නේ රජවරුන්ගෙන් ලැබුණු කඩු, කස්තාන, සේසත් දෙකක්, මුරායුධ වැනි සංකේතයන් ය. ''**පන්දම් කාරයෙක්**'' ලෙස එන පහළ කුලයේ පිරිමියෙකු දැල් වූ පන්දමක් මනාලයාගේ පා මුල පසෙකින් ගෙනයාම ද සිදු වේ.

මෙම ප්‍රදේශයේ පැරණි මංගල ඇඳුම වූයේ ''**රජ ඇඳුම**'' ලෙසින් හඳුන්වන ''**තුප්පොට්ටිය**'' යි. මනාලයා මෙන් ම දෙ වැනි මනාලයා ද මෙම ඇඳුමෙන් සැරසෙන අතර මනාලයා හඳුනා ගැනීමට ඔහුගේ හිසෙහි පළඳින

ඔටුන්න මලකින් සරසනු ලැබේ.මනාලිය අලංකාරවත් වටිනා සාරියකින් සරසනු ලැබේ. මනාලයා ගෙන එන මංගල ඇඳුම මනාලියට අන්දවනු ලබන්නේ අටමගලේ චාරිත්‍රවලින් පසුව ය. එය සාම්ප්‍රදායික උඩරට මංගල ඇඳුම යි. ඔසරිය ඇඳ, කරමාල හතක් පැළඳ, හිසට තැල්ලක් දමා, ඉතා අලංකාරවත්ව උඩරට මනාලියක් සැරසේ. ඇය කැන්දාගෙන ඒමට පිටත් වන මොහොතේ තරුණ කාන්තාවක් පිරුණු වතුර කළයක් රැගෙන **"පෙර මඟට"** පැමිණීම සුභදායක නිමිත්තක් වශයෙන් පහළ ඌවේ ගැමියෝ විශ්වාස කළහ. මනාල පාර්ශවය මනාලියගේ නිවසට පැමිණීමට පෙර කේලංකාරයා එහි පැමිණ මනාල පිරිස තවත් මොහොතකින් පැමිණෙන බවත් ඔවුන්ට පැනවිය යුතු ආසන සංඛ්‍යාවත් දැනුම් දෙයි. මනාලයාගේ පාර්ශවය මනාලියගේ නිවසේ **"ඉඳි කඩුල්ල"** ළඟට විත් නතර වේ. වෙඩික්කාරයා ඉන් පසු ක්‍රියාත්මක වන අතර එහි දී පණිවිඩ හුවමාරුව සිදු වන්නේ අහසට වෙඩි තැබීමෙනි.

| | | | |
|---|---|---|---|
| පළමු වන වෙඩිල්ල | ⟶ | අපි ආවා | (මනාලයාගේ පාර්ශවය) |
| දෙ වන වෙඩිල්ල | ⟶ | හොඳයි ! | (මනාලියගේපාර්ශවය) |
| තෙ වන වෙඩිල්ල | ⟶ | අපි එනවා | (මනාලයාගේ පාර්ශවය) |
| හතරවන වෙඩිල්ල | ⟶ | හොඳයි ! | (මනාලිගේ පාර්ශවය) |

ඒ අවසරයෙන් මනාලියගේ නිවස සීමාවට සැපත් වන මනාලයා නිවසට ඇතුළු වන්නේ **"පේවිල්ලක්"** හෙවත් **"පියවිල්ලක්"** මතිනි. පාවාඩයක් ලෙස අතුරන මෙය සුදු රෙද්දකි. පේවිල්ල දමන කාන්තාව පහළ කුලයේ කෙනෙක් වන අතර ඇයට ගරු කිරීමක් ලෙස බුලත් හුරුල්ලක් සමඟ පඩුරු දීම සිදු වේ. ඒ අතරතුර බරකාරයින් ගෙනා **"බර"** **"ගබඩාගේට"** භාර දෙනු ලැබේ. මනාලයා නිවසට ඇතුළු වන දොරකඩ මනාලියගේ සහෝදරයෙකු සිටින අතර මනාලයාගේ **"දෙපා සේදීම"** ඔහු විසින් සිදු කරයි. ඊට සැලකීමක් ලෙස මනාලයා වතුර භාජනයට මුදුවක් දමා නිවසට ඇතුළු වේ. නිවස තුළට පැමිණි පිරිසට අසුන් ගැනීමට **"කේලංකාරයා"** විසින් මඟ පෙන්වීම කරන අතර මුලින් ම අසුන් ගන්නේ **"දැනමුතුරාළ"** ය. ඉන් පසු සංග්‍රහ කිරීම් ආදිය සිදු වේ. මනාලයා දුර බැහැර අයෙක් නම් **"නැකැත් ගැනීම"** පසුදාට කල්දමන ලදි. එදා රාත්‍රිය මනාලියගේ නිවසේ සියල්ලෝ ම ගත කරන අතර දැනමුතුරාළ විසින් කියනු ලබන රප කතා, තමන්ගේ කුලයේ, වංශයේ, **"ලොකුකම්"** ගැන කියවෙන කතා ආදියෙන් රැය පහන් කරනු ලැබේ. මංගල චාරිත්‍ර සිදුකරන පසු දා එම චාරිත්‍ර බෞද්ධාගමට මුල් තැනක් දී සිදු කරනු දැකිය හැකි ය. අතීතයේ පහළ ඌව ප්‍රදේශයේ **"පෝරුවේ තැබීමක්"** සිදු නොවූ අතර එම චාරිත්‍ර සිදු වූයේ **"අටමගලක"** ය. මෙහි දී තැලි පිළි ඇන්දවීම තුළින් තමා සතු කර ගැනීමත් ජීවිත කාලය පුරා ම ඇඳුම් පැළඳුම් ආදියෙන් සරසා සතුටින් තබන බවත් සංකේතවත් කෙරේ (ගුණරත්න, 2009.04.20).

පහළ ඌවේ මංගල චාරිත්‍රවල දී විවාහය ලියාපදිංචි කිරීමක් හෙවත් **"අත්සන් කිරීමක්"** සිදු නොවී ය. අටමගලේ චාරිත්‍රවලින් පසුව **"දැනමුතුකම් දීමෙන්"** අනතුරුව සුභ වේලාවකින් මනාල යුවළ නිවසින් එළියට ගැනීම සිදු වේ. ඉන් පසුව මහ බුලත් මල්ලේ තිබූ බුලත් ගෙන දෙමාපියන් වැඩිහිටියන් හට ආචාර කොට **"අවසර ගැනීම"** යෙදේ. පහළ ඌවේ ඇතැම් ප්‍රදේශවල මෙම චාරිත්‍රය **"ආදර බුලත් ගැනීම"** ලෙසින් ද හඳුන්වනු ලැබේ. එහි දී මනාලයාගේ දෙමාපියන් ලෙස පැමිණි අයට දෙමාපියන් විසින් තම දියණිය **"භාර කිරීම"** සිදු කෙරේ. අද පටන් තම දියණිය රැකබලා ගන්නා ලෙස ඉල්ලා සිටීම **"භාර කිරීම"** ලෙසින් හඳුන්වනු ලැබේ. අතීතයේ මඟුල්තුළාවල දී රථ වාහන පහසුකම් නො තිබූ නිසා පයින් ම කැන්දා ගෙන ඒම සිදු වී ඇත. මනාලිය කැන්දා ගෙන එන විට ඇයගේ වත්තේ වැට සීමාවෙහි ඇවැස්ස මස්සිනා කෙනෙක් හිඳී. නෑනා අයිති තමන්ට බවත් ඇය ගෙනයනවා නම් තමාට **"කඩුලු බුලත් විටක්"** දී අවසර ගෙන රැගෙන යන ලෙසත් කියමින් මස්සිනා විසින් මනාලයාට **"කඩුලු තහංචියක්"** පනවනු ලැබේ. හාස්‍ය රසයක් දනවන මෙම අවස්ථාව මඟින් මනාලියගේ අයිතිය ප්‍රකාශ වීමටත් වඩා අලුතින් ඇති වූ සම්බන්ධය තව දුරටත් සමීප කරවීමට ගැමියෝ බලාපොරොත්තු වූහ. මෙහි දී **'මහ බුලත් මල්ලේ'** ඇති බුලත් පුවක් ටිකක් ඉලත්තට්ටුවකට දමා සුදු රෙද්දකින් වසා මනාලියගේ අතට මනාලයා විසින් දෙනු ලබන අතර මනාලිය එය තම මස්සිනාට දෙන්නී ය . නෑනාට **"ආචාර සමාචාර"** කර බුලත් ඉලත්තට්ටුව ගන්නා මස්සිනාගේ කඩුලු තහංචිය ඉන් පසුව ඉවත් වන අතර මනාලිය කැන්දා ගෙන යාම සිදු වන්නේ ඉන් අනතුරුව ය (ප්‍රේමදාස,එච්.එම්.2009.05.11).

තම පුතු **"සහේට ගත්"** **"යේලි පොඩ්ඩ"** කැන්දාගෙන එන පෙරමඟට වී බලා සිටින මනාලයාගේ මව ඔවුන් පිළිගන්නේ කිරි වීදුරුවක් පොවමිනි. අලුතින් කැන්දාගෙන ආ යේලියට (ලේලිය මෙහි දී භාවිත වන්නේ **'යේලි'** යනුවෙනි) මවගේ කිරි සේ ආදරය, ගෞරවය, ලබා එයින් පෝෂණය වී සෞභාග්‍යය ලබා දෙන ලෙස එයින් අදහස් කෙරේ. මේ මංගල ගමනට පිටත් වූ පිරිසට සංග්‍රහ කිරීම් **"කලකුලී දීම්"** ආදියෙන් පසුව එම පිරිස විසිර යන අතර වැඩවසම් යුගයේ දී මොවුන්ට **"ගම් පංගු දීම"** සිදු වූ බව ගැමියෝ පවසති. විවාපත් වූ නව යුවළ තමන්ගේ මංගල රාත්‍රිය ගත කරන්නේ මනාලයාගේ නිවසේ දී ය. විවාහ පත් වූ නව යුවළකගේ ජීවිතයේ එළඹෙන වැදගත් අවස්ථාවක් ලෙස **"දෙවනි ගමන"** හෙවත් **"ඉසද්දිය මංගල්‍යය"** හැඳින්විය හැකි ය. ඉසද්දිය මංගල්‍යය යනු **"විවාහපත් මනාලියකගේ කන්‍යාභාවය තහවුරු කෙරෙන සිංහල මංගල සිරිත දෙවැනි ගමන........"** යනුවෙන් ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ දක්වා ඇත. මනාලයාගේ නිවසට කැන්දා ගෙන යන මනාලිය දින තුනක් ම මංගල ඇඳුම පිටින් කාලය ගත කිරීම අතීතයේ යකුන්නාව, සෙන්පතිගම, වෑගම... වැනි පහළ ඌවට අයත් ගම්වල තිබූ අපූරු චාරිත්‍රයකි. තුන් වැනි දින උදයේ මෙම ඇඳුම ලිහා දැමීම සිදු කරන අතර මනාලියගේ දෙමාපියන් මනාලයාගේ නිවසට පැමිණීම ද මෙම දිනයේ සිදු වේ. ඔවුන් **"කිරි වේලාවට පෙර"**

එනම් ගස්වල කොළ කැඩීමෙන් පසු කිරි වැටෙන වෙලාව හෙවත් පෙ.ව. හයත්, දහයත් අතර මනාලයාගේ නිවසට පැමිණේ. එහි දී මනාලියගේ ඇඳුම පරීක්‍ෂා කිරීම සිදු වේ. මනාලියගේ පාරිශුද්ධත්වය පිළිබඳව ලැබෙන නිගමනය කුමක් වුව ද අතීතයේ එය ගැටලුවක් කර ගැනීමට තරම් ගැමියෝ අඥාන නොවූ හ. චාරිත්‍රයක් ලෙස **"කිළිකඩ හේලය"** පරීක්‍ෂා කිරීම සිදු කළ ද එය නව යුවළගේ ජීවිතයට අහිසි බලපෑමක් සිදු කරන ගැටලුවක් බවට පත් කර නො ගැනේ . මෙම චාරිත්‍රයෙන් පසුව මනාල යුවළට නෑමට අවසර ලැබේ. විවාහයෙන් පසුව මුල් වතාවට **"ඉසෙහි දිය නාන දිනය"** මෙය වූ නිසා මෙය ඉසදිය මංගල්‍යය වූවා යැයි මෙහි ගැමියන්ගේ විශ්වාසය යි. එදිනට රෙදි නැන්දා පැමිණ නිවසේ සියලු දෙනාගේ ම ඇඳුම් ගෙන ගොස් සෝදා නැවත ගෙනදීම ද අනිවාර්යයෙන් ම සිදු කරන්නකි.

ඉසදිය මංගල්‍යය දිනයේ දෑවැදි පිළිබඳ කතාබහ ද සිදුවීම අනිවාර්ය ය. අතීතයේ නම් දියණියගේ පැවැත්මට අවශ්‍ය ඉඩකඩම් දේපළ ආදිය තමන්ගේ **"තරාතිරමට"** අනුව දෑවැද්ද ලෙස ලබා දුනි. එය ද මනාලයාගේ ඉල්ලීමක් හෝ කැමැත්ත පිට සිදුවන දෙයක් නො වීම සුවිශේෂී කරුණකි. මේ මඟින් එදා චාරිත්‍ර සහ අද චාරිත්‍ර අතර ඇති වෙනස මනාව පසක් වේ. උසස් පරම්පරාවල දියණියක දීග දෙන විට විශාඛාවට මෙන් අවවාද, උපදෙස් ද, දේපළ වස්තූන් ද දීම මෙම පළාතේ ද සිදු වන්නකි. පහළ ඌවේ ඇතැම් පළාත්වල මෙය **"මඟ ගමන යනවා"** යනුවෙන් හැඳින්වෙන්නේ ද එදිනට දියණියගේ දෑවැද්ද රැගෙන මනාලයාගේ නිවසට යන බැවිනි (ආරියසේන, 2009.04.20).

ඉසදිය මංගල්‍යයෙන් පසුව පළමුවෙන් පන්සලේ හාමුදුරුවන් මුණ ගැසීමට යාම පහළ ඌවේ විවාහ පත් නව යුවළක් විසින් කළ යුතු ම චාරිත්‍රයකි. නව ජීවිතයට ආශිර්වාද ලබා ගෙන **"දන් පැන් දී"** නෑ ගමන් යාම ආරම්භ කිරීම සාමාන්‍ය සිරිතයි. නෑ ගෙවල්වල දී හොඳින් සංග්‍රහ කිරීම සිදු වන අතර වෙනත් තෑගි බෝග දීමක් අතීතයේ සිදු වී නොමැත. නමුත් වර්තමානයේ තත්ත්වය ඊට වඩා වෙනස් ය. නෑ පිරිස අතර දරුවන් නොමැති නැන්දා මාමා යුවළක් සිටී නම් ඔවුන් කැමැත්තෙන් ම තම දේපළවලින් කොටසක් නව යුවළට පරිත්‍යාග කිරීම එදා සිදු විය. විවාහ බැඳීම ශක්තිමත් කිරීමට දේපළ යන සංකල්පය කොතරම් වැදගත් කොට සැලකුවා ද යන්න මෙහි දී මැනවින් තහවුරු වේ. දීග විවාහයක දී නව යුවළ **"මහ ගෙදරින්"** වෙන් වී වෙන ම පදිංචි වී **"ගෙයිබන්ධනය"** ශක්තිමත්ව සකස් කර ගැනීමට හුරු පුරුදු වේ. එහි දී දෙමාපියන්ගේ අවවාද උපදෙස්වලට අනුව ගෙයි බන්ධනය පවත්වාගෙන යාමට ඔවුහු සමත් වෙති. පවුල් ජීවිතය තුළ දී එකිනෙකා හඳුනා ගැනීමට ඔවුන්ට ම ආවේණික වූ වහරක් යොදා ගනු ලැබේ. බිරිය හැඳින්වීමට **"අපේ උන්දෑ"** යන පදය ද සැමියාට **"අපේ ඇත්තෝ"** යන පදය ද භාවිත වන අතර දුර සිට අමතන විට **"මේ ඇහුනද? දූලගේ අම්මේ පොඩ්ඩක් මෙහාට ආවනම්"** යනාදී ලෙස කතා කරති. මෙම ප්‍රදේශයේ ස්වාමි පුරුෂයාට **"සකියා"** යන පදය ද භාවිත වේ (කහඳගමගේ, 1998).

මේ ආකාරයට පහළ ඌවේ ජන ජීවිතය හා බැඳී පවතින විවාහ චාරිත්‍ර ද ජනවහර පිළිබඳව ද කරුණු අනාවරණය කර ගත හැකි ය.

## ප්‍රතිඵල හා නිගමන

මෙම තොරතුරු බොහෝමයක් සම්මුඛ සාකච්ඡා සහ සිද්ධි අධ්‍යයනය යන ක්‍රමවේදයන් මගින් රැස් කරගත් ඒවා ය. මෙම ගවේෂණයෙහි අවසානයේ දී ලැබුණු ප්‍රතිඵල නම්,

- ★ පහළ ඌව ජන ජීවිතය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.
- ★ ඔවුන්ගේ විවාහ චාරිත්‍ර සෙසු පළාත්වල විවාහ චාරිත්‍ර චාරිත්‍රවලින් වෙනස් වන අයුරු හඳුනා ගැනීම.
- ★ මෙම ප්‍රදේශයෙහි ජනවහරෙහි සුවිශේෂතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම යනාදිය දැක්විය හැකි ය.

එසේ ම මෙම චාරිත්‍ර අද වන විට යම් යම් වෙනස්වීම්වලට ලක් වී ඇත. තාක්‍ෂණික දියුණුව, විවිධ රැකියාවන්හි නියුතු වීම... වැනි හේතූන් නිසා ගමෙහි රැඳෙන පිරිස අල්ප ය. ඒ නිසා ම මෙම චාරිත්‍ර චාරිත්‍රවලට පෞරාණික වැදගත් කමට අද වන විට නවීන අංගෝපාංග එක් වී ඇත.එදා ගැමි ගෙදරක පැවැත්වූ මංගල උත්සවය නගරයේ හෝටලයක පැවැත්වීමට පවා අද ඇතමෙක් පෙළඹෙති. එහෙත් එම තත්ත්වය තවමත් වැළඳ නො ගත් දේශීය සභ්‍යත්වයට ගරු කරන ජනතාවක් වෙසෙන ප්‍රදේශයක් ලෙස පහළ ඌවෙහි බිබිල හා මැදගම ප්‍රදේශ හැඳින්විය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කහඳගමගේ, පි. (1998), ප්‍රාදේශීය ව්‍යවහාර, චතුර මුද්‍රන ශිල්පියෝ : වැල්ලම්පිටිය.
සුමංගල හිමි, වැලිවිටියේ (1999), ශ්‍රී සුමංගල ශබ්දකෝෂය. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ :කොළඹ.

## දත්ත දායක නාමලේඛනය

ආරියසේන, එල්. ඒ. (2009.04.20), අවු.48, ගොවිතැන, "අරුණපාය", බදුල්ලකැටිය, බිබිල.
ගුණරත්න, එච්. එම්. (2009.05.09), අවු.68, විශ්‍රාමලත් සිංහල ගුරු උපදේශක,"සෙව්වන්දි", යකුන්නාව, නන්නපුරාව.
ප්‍රේමදාස, එච්. එම්. (2009.05.11) අවු.52, ගොවිතැන, වෑගම, බිබිල.